# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2019.10.31 |
|---|---|---|---|

ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
385,සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.

**සීමාවාසික වෛද්‍යවරුන් ලෙස සිය පුහුණු කාලයේ නිරත වෛද්‍යවරුන්ට තමන්ගේ පරමාධිපත්‍ය උරගා බැලීමේ අවස්ථාව ලබාදීම සම්බන්ධවයි**

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ විධි විධාන නිසි ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියළු දේ කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බලතල අප කොමිෂන් සභාවට හිමිව ඇත.

ඒ අනුව මැතිවරණයකදී සිය සර්වජන ඡන්දය භාවිතා කිරීම මඟින් පුරවැසියන්ට සිය පරමාධිපත්‍ය උරගා බැලීමට අවස්ථාවක් හිමි වේ. මෙවර මැතිවරණයේ දී සීමාවාසික වෛද්‍යවරුන් ලෙස සිය පුහුණු කාලයේ නිරත වෛද්‍යවරුන්ට තමන්ගේ පරමාධිපත්‍ය උරගා බැලීමේ අවස්ථාව අහිමිවීමට අත්‍යාසන්න තත්වයක් පවතින බවට තොරතුරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත. මේ සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. ඒ අනුව මෙම කණ්ඩායම වෙත සිය ඡන්දය භාවිතා කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කර ඒ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වමු.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව වැඩිදුරටත් දන්වමු.

T. D. Wimalasuriya
Secretary - Att.Du
Human Rights Commission of Sri Lanka

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත : මැතිවරණ කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන